ඌව පළාත් සභාව 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

* මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළයුතු වුවද ඌව පළාත් සභාවට එරෙහිව පවරා ඇති විභාගවන නඩු කටයුතු 02 ක් සම්බන්ධයෙන් වූ රු. 2,300,000 ක අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	අදාළ නඩු මේ වන විටත් විභාග වෙමින් පවතින හෙයින් බැරකම් ප්‍රමාණය නිශ්චිතවම තීරණය වී නොමැති හෙයින් ගිණුමේ අනාවරණය කිරීම් යටතේ දක්වා නොමැති බව.	නඩු පවරා ඇත්තේ පළාත් සභාවට එරෙහිව බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ඌව පළාත් සභා මුදල් රීති 510.2 (ආ) අනුව වාණිජ අත්තිකාරම් ගිණුම් 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේදී උපයන ලද එකතුව රු. 91,896,715 ක් වූ අතිරික්තය පළාත් සභා ආදායමට බැර කර නොතිබුණි. එමෙන්ම එසේ බැර නොකිරීම හේතුවෙන් වාණිජ අත්තිකාරම් ගිණුම්වල උපරිම හර ශේෂ සීමා ඉක්මවීම් නිරීක්ෂණය විය.	සියලුම ආදායම් මූල්‍ය පදනම මත පමණක් ගිණුම්ගත කරන අතර වාණිජ අත්තිකාරම් ගිණුම්වල වාර්ෂික ලාභාලාභ සටහන් යටතේ පමණක් අනාවරණය කරන බවත්, ආදායම් ප්‍රේෂණය කරන අවස්ථාවේදී ආදායම් යටතේ ගිණුම්ගත කරන බව.	පළාත් සභා මුදල් රීති 510.2(ආ) අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	ඌව පළාත් සභා මුදල් රීති 509.1 අනුව ස්ථාවර වත්කම්වල වාර්ෂික ක්ෂය ප්‍රමාණය ක්ෂය සංචිත අරමුදල් ගිණුමට බැරකළ යුතු වුවද වාණිජ අත්තිකාරම් ගිණුම් 6 කට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ස්ථාවර වත්කම් ක්ෂය රු. 11,318,361 ක් පළාත් සභා ක්ෂය සංචිත අරමුදලට බැර කර නොතිබුණි. එසේම, වාණිජ අත්තිකාරම් ගිණුම් 04 කට අදාළව ඉකුත් වර්ෂය වෙනුවෙන් ක්ෂය සංචිත අරමුදලට බැර කළ යුතු රු. 17,276,404 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් බැර කර නොතිබුණි.	2024 වර්ෂයට අදාළ වන මෙම ක්ෂය සංචිත වටිනාකම වර්ෂයේ ගිණුම් සකස් කිරීමෙන් අනතුරුව 2025 වර්ෂයේදී ලබා ගැනීමට කටයුතු කරන අතර මීට පෙර වර්ෂයන්වලදී ද අදාළ වර්ෂයේ ක්ෂය සංචිත ඊට පසු වර්ෂයේදී ප්‍රේෂණය කර ඇති බව, හා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයේ ක්ෂය වටිනාකම,ක්ෂය සංචිත අරමුදල වෙත බැර කර නොමැති අතර ප්‍රමාණවත් මුදල් ලද වහාම ක්ෂය වටිනාකම ක්ෂය සංචිත අරමුදල වෙත බැර කිරීමට කටයුතු කරන බව.	පළාත් සභා මුදල් රීති 509.1 ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	ඌව පළාත් සභාවේ වාණිජ අත්තිකාරම් ගිණුම් 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 448,039,390 ක ජංගම වත්කම්, රු. 9,576,610 ක ජංගම වගකීම් සහ රු.10,000,000 ක ස්ථාවර තැන්පතු ශේෂ ඌව පළාත් සභාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි.	අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් සඳහා වෙනම ගිණුම් පවතින බැවින් එම තොරතුරු ඒකාබද්ධ ගිණුම තුළ හෙළිදරවු නොකරන බව.	සියළු වත්කම් හා වගකීම් ශේෂ ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගෙවිය යුතු/ උපචිත වියදම්, සහ ඌව පළාත් සභාවේ ආයතන 06 ක විසර්ජන ගිණුමේ බැරකම් ප්‍රකාශය තුළ දක්වා තිබූ බැරකම් ශේෂ අතර රු. 29,206,905 ක වෙනසක් නිරීක්ෂණය විය.	ආයතන 03 ක ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය නිවැරදි බවත්, අනෙක් ආයතනවල සටහන් කිරීමේ දෝෂ පවතින බැවින් ඉදිරියේදී නිවැරදි කරන බව.	ගිණුම් ශේෂ සසඳා නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 702 - ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් සභා මුදල් රීති 371.2.2	ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව, එක්	ඉදිරියේදී නැවත අත්තිකාරම් මුදල් ලබා	ඌව පළාත් සභා

අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම මුදල ඉක්මවා අවස්ථා 4 කදී රු. 300,000 සිට 1,600,000 දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.	ගන්නා විට අවශ්‍ය උපදෙස් පිළිපදින බව.	මුදල් රීති 371.2.2 අනුව කටයුතු කළ යුතුය.

1.5.2 ශීර්ෂය 704 - ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ ඉඩම් පිළිබඳ අමාත්‍යාංශය

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රමාද වූ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්වැල්ලවත්ත පහළ කොටස ශ්‍රී ශන්මුගන්ද පාසල අසල සිට වතු කම්කරු නිවාස වෙත යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.1,250,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	ප්‍රතිපාදන නියමිත කාලය තුළ උපයෝජනය කළ යුතුය.

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ නවෝත්පාදන හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් නවෝත්පාදන විද්‍යාගාර පිහිටුවීම සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් ස්වරූපයේ වත්කම් මිල දී ගැනීමට 2021 වර්ෂයේදී පාසල් වෙත ලබා දී තිබුණු රු.500,000 බැගින් වූ පාසල් පාදක ප්‍රදාන වලින් එකතුව රු.1,365,372 ක් වූ ප්‍රදාන පාසල් 07 ක් විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 23 දිනැති 20/2021 චක්‍රලේඛය අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා උපයෝජනය නොකර පාසල් සංවර්ධන සමිති ගිණුමේ නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.	උපයෝජනය පිළිබඳ ප්‍රගතිය ලබාගනිමින් පවතින බව.	අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය.

1.5.3 ශීර්ෂය 706 - කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශය

කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බීජ අර්තාපල් විශේෂ අත්තිකාරම් ගිණුමේ හිඟ ණය ශේෂය රු. 7,941,153 ක් වූ අතර වර්ෂ 10 කට අධික කාලයක් පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණ ද ණය වාරික ක්‍රමාණුකූලව අයවී නොමැති බව පසුගිය වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ අයකර ගැනීම් අනුව නිරීක්ෂණය විය.	ණය ශේෂය සුළු වශයෙන් අයවෙමින් පවතින බව හා විධිමත් පරිදි කපාහැරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂිත බව.	නියමිත කාලය තුළ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.4 ශීර්ෂය 708 - මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමූපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හා ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මොනරාගල කඳුරට විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ඉඩමක රු.8,148,264 ක මුදලක් වැය කර 2011 වර්ෂයේ වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණ ද 2018 වර්ෂයේ සිට එය වසාදමා නිෂ්කාර්යව පැවතුණි. එසේම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ දී රු.5,065,000 ක ණය මුදලක් සභාපති සී/ස මොනරාගල විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබා දී එය වසරක සහන කාලයකින් පසුව වාරික 60 කින් අය කර ගැනීමට (වසර 5 කින්) ගිවිසුම් ගතව තිබූ අතර මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද එම මුදලින් එක් වාරිකයක් හෝ අය වී නොතිබුණි.	සි/ස මොනරාගල කඳුකර විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සහල් සැකසුම් මධ්‍යස්ථානය එවකට තක්සේරු කළ වටිනාකම වන රු.5,065,000/- මුදල ගෙවීම සඳහා වසරක සහන කාලයකින් පසු වාරික 60 කින් ගෙවීමට ගිවිසුම් ගත වුවද, පැවති අලාභදායි තත්ත්වය හේතුවෙන් වාරික මුදල් ගෙවා නොමැති අතර මීට අදාළව වර්තමාන ලියවිලි තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බැවින් තක්සේරු වටිනාකම ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කරන බව.	වත්කම් නිෂ්කාර්යව නොතැබිය යුතුය.

1.5.5 ශීර්ෂය 709 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල (පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හැර)

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) සේවකයින් 185 ක් අතිරික්ත සේවයේ යොදවාගෙන තිබුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 715 ක් විය.	අදහස් දක්වා නොතිබුණි.	කාර්ය මණ්ඩලය තුලනයක් සහිතව පවත්වාගත යුතුය.

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසානයට ගුරු සහායක කාර්ය මණ්ඩලය සඳහා 1498 ක් සහ වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 06 ක් අතිරික්තව සේවයේ යොදවාගෙන තිබුණි. විදුහල්පති සේවයේ තනතුරු 219 ක් සහ ගුරු සේවයේ තනතුරු 2766 ක් පුරප්පාඩුව පැවතුණි.	2024 දෙසැම්බර් 31 දිනට විදුහල්පතිවරුන් 1153 ක් අනුමත ඇති අතර, මේ වන විට 1009 ක ප්‍රමාණයක් සේවයේ යෙදී සිටින අතර 144 ක පුරප්පාඩුවක් පවතී. ගුරුභවතුන් 19,226 ක් අනුමත වී ඇති අතර මේ වන විට 16,521 ක ප්‍රමාණයක් සේවයේ යෙදී සිටින අතර, 2705 පුරප්පාඩුවක් පවතී. සහාය කාර්යය මණ්ඩල යටතට ගැනෙන (PL කාණ්ඩයට අයත්) පාසල් කාර්යය සහායක, පුස්තකාල සහායක, විද්‍යාගාර සහායක, පාසල් කම්කරු, මුරකරු සියලුම නිලධාරීන් 2478 ක් අනුමත වී ඇති අතර, මේ වන විට එම තනතුරු වලට අදාළව සේවයේ යෙදී සිටින ප්‍රමාණය වන්නේ 2481 ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව එම තනතුරු වලට අදාළව නිලධාරීන් 03 දෙනෙකුගේ අතිරික්තයක් පවතින අතර, පාසල් කාර්යය සහායක තනතුරෙහි 784 දෙනෙකු අනුමත වී ඇති අතර, 381 ක් පමණක් සේවයේ යෙදී සිටී. එහි පුරප්පාඩු ප්‍රමාණය 403 ක් වේ. අනෙකුත් සියලුම තනතුරු වල අතිරික්තයක් පවතී.	කාර්ය මණ්ඩලය තුලනයක් සහිතව පවත්වාගත යුතුය.

	MN කාණ්ඩයට අයත් රසායනාගාර සහකාර තනතුර සඳහා නිලධාරීන් 109 දෙනෙකු අනුමත වී ඇති අතර, මේ වන විට 37 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටී. එහි පුරප්පාඩු ප්‍රමාණය 72 ක් පමණ වේ. මීට අමතරව පාසල් සඳහා සංවර්ධන නිලධාරීන් යොදවා ඇති අතර, ඔවුන් කාර්යය මණ්ඩල වාර්තාව මගින් අනුමත කර නොමැත. සමස්ථයක් ලෙස ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල අතිරික්තයක් ඇති අතර මේ සඳහා හේතුවී ඇත්තේ ඇතැම් තනතුරු ප්‍රමාණයක් අදාළ නිලධාරියාට පෞද්ගලික වනසේ ලබා දී ඇති බැවිනි.	

(ඇ) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වෙනත් (අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) සේවකයෙකුගේ අතිරික්තයක් සහ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 561 ක් වූ අතර එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් හා ආර්ථික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2020 හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක DMS/Policy/Recruitments හා 2019 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින් සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට දන්වා ඇති බැවින් ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පවතින පුරප්පාඩු පිරවීමට අපහසු වී ඇත. ඌව පළාත විවිධ භූ විෂමතාවයන් සහිත මෙන්ම ඇතැම් සෞඛ්‍ය ආයතන දුෂ්කර හා පොදු ප්‍රවාහන සේවාවන් නොමැති ප්‍රදේශවල පිහිටා ඇත. එහෙත් රෝගී සත්කාරක සේවාවන් නොපිරිහෙලා ඉටුකළ යුතු බැවින් සේවා අවශ්‍යතාවය මත අත්‍යාවශ්‍යම පුරප්පාඩු තනතුරු බඳවා ගැනීමට විවිධ අවස්ථාවන්හි රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය, ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.	කාර්ය මණ්ඩල කළමනාකරණය කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

1.5.6 ශීර්ෂය 710 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදීගෙන තිබුණු රු. 1,104,564 ක් වටිනා Card Printers සහ Barcode Readers අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන රෝහල් ගබඩාවන්හි දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව සහ ඌන උපයෝජිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.	රේඛීය අමාත්‍යාංශය විසින් විවිධ ව්‍යාපෘති යටතේ රෝහල් ජාලගත කිරීමේ අරමුණින් Bar Cord Readers හා Card Printers රෝහල් වෙත ලබා දී ඇති අතර, මේ වන විට දියතලාව මූලික රෝහල කේන්ද්‍ර කර ගනිමින් කාඩ්පත් ජාලගත කිරීම මේ වන විට සිදු කරමින් පවතී. තවද මෙම ජාලගත කිරීම සඳහා වැලිමඩ මූලික රෝහල, මහියංගන මූලික රෝහල සහ බණ්ඩාරවෙල දිස්ත්‍රික් රෝහල මූලික කර ගනිමින් සිදු කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් ලබා දී ඇති අතර, එය ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බව.	හඳුනාගත් අවශ්‍යතා සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවිය යුතු අතර වත්කම් නිෂ්කාර්යව නොතැබිය යුතුය.
(ii)	බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු රු. 18,834,988 ක් වටිනා ශල්‍ය වෛද්‍ය තොග මිලදී ගැනීමේදී අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන ශල්‍ය වෛද්‍ය උපකරණ ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.	අවශ්‍යතාවය පවතින සෞඛ්‍ය ආයතන සොයා බලා බෙදාදීමට කටයුතු කරන බව.	අපේක්ෂිත අරමුණු සඳහා යොදාගත යුතුය.

1.5.7 ශීර්ෂය 711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් අධ්‍යාපන කලාප 08 කට අයත් නිල නිවාස 305 ක් අවසන් වරට තක්සේරු කර තිබුණේ 1988 මාර්තු 19 – 2019 ජුලි 05 කාලපරිච්ඡේදය තුළ වීමෙන් යාවත්කාලීන තක්සේරු වාර්තා මත පදනම්ව ආර්ථික කුලිය අයකිරීම සිදු නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද අධ්‍යාපන කලාප 05 කට අයත් නිල නිවාස 144 ක් විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 18 දින වන විටත් තක්සේරු කර නොතිබුණි.	නිල නිවාස තක්සේරු කර දෙන ලෙස, 2024 දෙසැම්බර් 09 දින, බදුල්ල ප්‍රධාන තක්සේරු නිලධාරි වෙත ලිඛිතව දන්වන ලද බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ii)	මොනරාගල අධ්‍යාපන කලාපයේ රසායනාගාරයක් නොමැති මො/මුතුකණ්ඩිය 2 පියවර කණිෂ්ඨ විද්‍යාලය සඳහා රසායනාගාර සේවකයෙකු	නිශ්චිත ක්‍රමවේදයකින් තොරව අවිධිමත් පදනමක් යටතේ බඳවාගෙන ඇති බව හා තනතුරු නාමය නොසලකා	මානව සම්පත් ඌණ උපයෝජනය

	සේවයේ යොදවාගෙන 2024 ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වැටුප් ලෙස ගෙවා තිබූ රු.575,370 ක මුදල නිශ්ඵල වියදමක් ලෙස නිරීක්ෂණය වේ.	රාජකාරි පැවරීම සිදුකරන බව.	වැලැක්වීමට කටයුතු කළ යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සිසුන් දෙදෙනෙකු පමණක් ඉගෙනුම ලබන මො/වෙහෙරබැදිතැන්න ප්‍රාථමික විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු සඳහා ගුරුවරයන් දෙදෙනෙකු සේවයේ යෙදවීමට අමතරව සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු ද පත්කර 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වැටුප් වශයෙන් රු.3,233,850 ක් ගෙවා තිබුණි.	මෙම පාසල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා වාර්තාවක් සකස් කර ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකරන ලෙස අධ්‍යාපන ලේකම් විසින් දන්වා ඇති බව.	අවශ්‍යතාවය හඳුනාගෙන මානව සම්පත් කළමනාකරණය කළ යුතුය.
(ii)	ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ ක්ෂය ද්‍රව්‍ය හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා 2022 ජනවාරි 05 දින රු.300,000 බැගින් පාසල් වෙත ලබා දී තිබුණු පාසල් පාදක ප්‍රදාන වලින්, එකතුව රු.1,089,773 ක් වූ ප්‍රදාන පිළිබඳව නියැදි පදනම මත පරීක්ෂා කිරීමේදී ඉන් පාසල් 08 ක් විසින් අදාළ මිල දී ගැනීම් සිදු නොකර පාසල් සංවර්ධන ගිණුමේ එකී ප්‍රධාන වසර ගණනක් නිශ්කාර්යව රඳවා ගෙන තිබුණි.	උපයෝජනය සිදුකරන ලෙස විදුහල්පතිවරුන් දැනුවත් කළ බව.	අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය.
(iii)	අධ්‍යාපන අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන - රා.ආ.) 2024 ජූලි 01 දිනැති අංක ED/01/103/02/06(IV) දරන චක්‍රලේඛය අනුව ඉලක්කගත විෂයන් සංවර්ධනය සඳහා ලබා දෙන ලද එකතුව රු.6,290,000 ක් වූ පාසල් පාදක ප්‍රදානයන් 2024 ඔක්තෝබර් 31 දින වන විට උපයෝජනය කර අවසන් කළ යුතු වුවත් 2024 නොවැම්බර් 01 දින වන විටත් පාසල් 22 ක එකතුව රු.2,704,334 ක් වූ ප්‍රදාන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.	මුදල් උපයෝජනය නොකර ඉතිරිව ඇති පාසල්හි විදුහල්පතිවරුන් වෙත එම මුදල් 2025 මැයි 31 දිනට උපයෝජනය කර ප්‍රගතිය ලබා දෙන ලෙස දැනුවත් කර ඇති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඌව පළාත තුළ විධිමත් ගුරු තුලනයක් සිදු නොකිරීම	ඉදිරියේදී ක්‍රියාත්මක වන ගුරු මාරු මණ්ඩල ප්‍රතිපත්තීන් අනුව තුලනය කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා	විධිමත් පරිදි ගුරු තුලනයක් කිරීමට කටයුතු කළ

	හේතුවෙන් 2024 ජුනි මස අවසානයට අධ්‍යාපන කලාප 08 ක පාසල් 605 ක ගුරුවරු 2828 දෙනෙකුගේ ඌනතාවයක් පවතින පසුබිමක අධ්‍යාපන කලාප 02 ක් පාසල් 145 ක ගුරුවරු 338 දෙනෙකුගේ අතිරික්තයක් පවත්වාගෙන යමින් එකී අතිරික්ත කාර්ය මණ්ඩලයට 2023 ජනවාරි මස සිට 2024 ජුනි මස දක්වා එකතුව රු. 446,740,525 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. කලාප 02 ක ගුරු අතිරික්තයක් පැවතිය ද ගුරු තුලනයක් සිදු නොකිරීම හේතුවෙන් පාසල් 178 ක ගුරුවරු 622 දෙනෙකුගේ ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.	කරන බව.	යුතුය.
(ii)	මොනරාගල කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව පුස්තකාල සේවක තනතුරු 13 ක ද රසායනාගාර සේවක තනතුරු 31 ක ද අතිරික්තයක් නිරීක්ෂණය වූ අතර එම අතිරික්ත කාර්ය මණ්ඩලයේ 39 දෙනෙකු වෙනුවෙන් 2024 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වැටුප් වශයෙන් රු. 21,990,799 ක් ගෙවා තිබුණි.	රාජ්‍ය සේවයට අවිධිමත් පදනමක් මත බඳවාගෙන ඇති බවත්, නිශ්චිත ස්ථානමාරු ප්‍රතිපත්තියක් නොමැති බවත් විදුහල්පතිගේ වැඩ පැවරීම අනුව රාජකාරි සිදුකරන බව.	කාර්ය මණ්ඩල පරිපාලනය පිළිබඳ අවධානය යොමුකළ යුතුය.

1.5.8 ශීර්ෂය 712 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

(අ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

හිඟ ආදායම්

(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 905,889,335 ක් අයකර ගෙන නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	පනත් හා අතුරු ව්‍යවස්ථා අනුව හිඟ ආදායම් අයකරගත යුතුය.
(ii)	1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු උසාවි දඩ රු. 187,446,243 ක් හා මුද්දර ගාස්තු රු. 619,981,105 ක් ගෙවා නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අදාළ පනත්වල විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

(ආ) නිකුත් කර තිබුණු අධිභාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා නියෝජිතයින්ට පනවා තිබුණු අධිභාර වෙනුවෙන් රු. 4,357,522 ක් අය විය යුතුව තිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අදාළ පනත්වල විධිවිධාන අනුව අධිභාර අයකරගත යුතුය.

1.5.9 ශීර්ෂය 713 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මොනරාගල හා බදුල්ල දිස්ත්‍රික්ක තුළ ලියාපදිංචිය ලබා ගෙන තිබු සමුපකාර සමිති සංඛ්‍යාව 1500ක් වූ අතර 2025 ජනවාරි 01 දින වන විට ක්‍රියාකාරිව පැවතියේ සමිති 510ක් හෙවත් ලියාපදිංචි සමිති සංඛ්‍යාවෙන් සියයට 33 ක ප්‍රතිශතයක් පමණි. ඒ අනුව අක්‍රිය සමිති නැවත සක්‍රිය තත්ත්වයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගෙන නොතිබුණි.	අක්‍රිය සමිති ඈවර කිරීමේ කටයුතු සිදුකරන බව.	මනා අධීක්ෂණයක් පවත්වාගත යුතුය.

1.5.10 ශීර්ෂය 714 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(අ) අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම්**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මුදල් රෙගුලාසි 396	බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්මා වූ රු. 4,328,798 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් පළාත් සභා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව.	මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කළ යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2024 ජනවාරි 31 දිනැති අංක 7/3/1/Annual plan/2024 දරන ලිපියෙහි (2) ඡේදය අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙතෙක් ක්‍රියාත්මක	පරිගණක ගත පද්ධතියක් පවත්වාගෙන යාමට කෘෂිකර්ම උපදේශක කොට්ඨාසවල පරිගණක පහසුකම්, මානව සම්පත් මෙන්ම අන්තර්ජාල	කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

කරන ලද හා 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් හා ප්‍රතිලාභීන්ගේ විස්තර ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණ ද විගණිත දිනය වූ 2024 ඔක්තොබර් 11 දින වන විටත් බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් එවැනි පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.	පහසුකම් ද නොපවතින බව.	

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මොනරාගල සහ බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාල මගින් 2022 සහ 2023 වර්ෂවල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සියයට 50 ගොවි දායකත්ව මුදලින් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ උපකරණ හා බීජ මිලදී නොගැනීම හේතුවෙන් එම ගොවීන් වෙත ප්‍රතිලාභ ලබාදීමට නොහැකි වී තිබුණු අතර ගොවීන්ගෙන් අයකර ගන්නා ලද සියයට 50 දායකත්ව මුදලින් රු.1,036,440 ක් ගොවීන් වෙත නිදහස් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	මොනරාගලට අදාළව පිළිතුරු ලබාදී නොතිබුණු අතර බදුල්ල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 612,276 ක් බව.	අදාළ කාලය තුළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකු ආධාර යටතේ ලද ප්‍රතිපාදනවලින් 2023 අගෝස්තු 23 දින වන විට රු. 14,369,186 ක් වැයකර, බොරලන්ද රජයේ සත්ත්ව ගොවිපල භූමියේ මෙට්‍රික් ටොන් 20 ක ධාරිතාවයෙන් යුතු ලූණු බීජ ගබඩාවක් සහ මෙට්‍රික් ටොන් 50 ක ධාරිතාවයෙන් යුතු අතිරේක ආහාර බෝග බීජ ගබඩාවක් ඉදිකර තිබුණ ද විගණන දිනය වූ 2025 අප්‍රේල් 29 දින වන විටත් එම ගබඩා නිෂ්කාර්යව පැවතුණි.	බොරලන්ද ප්‍රදේශයේ ලොකු ලූණු හෝ අතිරේක ආහාර බෝග වගාවන් සිදු නොවන බව හා ඉදිරියේදී මෙම ගබඩා සත්ත්ව ගොවිපලට පවරා දී වෙනත් කාර්යයක යෙදවීමට කටයුතු කරන බව.	වත්කම් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය.

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රමාද වූ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආහාර සුරක්ෂිතා වැඩසටහන සඳහා 2023 දෙසැම්බර් 12 දින ලද රු.50,000 ක මුදල ද 2023 ජනවාරි 16 දින දියතලාව හෙළ බොජුන්හලේ වැසිකිලිය ඉදිකිරීම සඳහා ලද රු.1,190,338 ක මුදල ද අදාළ කාර්යය ඉටු නොකර බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමෙහි නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.	පොදු තැන්පත් ගිණුම තුළ දැනට වසර 02ක් ඉක්මවා ඇති බැවින්, එය ආදායමට ගැනීමට පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතින් උපදෙස් විමසා ඇති බව.	ප්‍රතිපාදන අදාළ අරමුණු සඳහා යෙදවිය යුතුය.

(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැලිමඩ සහ මහියංගන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවල පිළිවෙලින් නිලධාරීන් 09 දෙනෙකු සහ 06 දෙනෙකු පමණක් සේවය කරමින් සිටි අතර එම නිලධාරීන්ගේ සහය සඳහා කාර්යාල කාර්යය සහායකයින් සහ දෙපාර්තමේන්තු කම්කරුවන් පිළිවෙලින් 05 දෙනෙකු සහ 06 දෙනෙකු සේවයේ යොදවා එම සේවකයින්ට 2023 වර්ෂයේදී සහ 2024 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා වැටුප් වශයෙන් වැලිමඩ සහ මහියංගන සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවල පිළිවෙලින් රු. 3,476,878 ක් සහ රු. 5,172,739 ක් ගෙවා තිබුණි.	වැලිමඩ කාර්යාලයෙන් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකුගේ ස්ථාන මාරු ක්‍රියාත්මකවී නොමැති බව හා එක් අයකු ස්ථානමාරු කර ඇති බව මහියංගනය කාර්යාලය මගින් දන්වා ඇත.	කාර්ය මණ්ඩල පරිපාලනය විධිමත් සිදුකළ යුතුය.

1.5.11 ශීර්ෂය 715 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙවර පෙරදැරිව, බොරලන්ද සත්ත්ව ගොවිපල තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) උපයෝජනය කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති යටතේ 2025 අප්‍රේල් 30 දින වන විට ඉදිකිරීම් සඳහා රු. 98,685,899 ක් සහ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා රු. 12,807,376 ක් වැයකර තිබුණ ද විගණන දිනය වූ 2025 අප්‍රේල් 29 දින වන විටත් ව්‍යාපෘති පරිශ්‍රයට තෙකලා විදුලිය සම්බන්ධතාවය ලබා නොගැනීම හේතුවෙන් ගොඩනැගිලි හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි.	කඩිනමින් අපේක්ෂිත අරමුණුවල යොදවන බව.	වත්කම් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය.

1.5.12 ශීර්ෂය 718 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ඌව පළාත් සහා මුදල් රීති සංග්‍රහය මුදල් රීති 383	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2020 නොවැම්බර් සිට 2024 නොවැම්බර් දක්වා ගිණුම් 02 කට අදාළව සිදුකර තිබුණු රු. 2,007,237 ක සෘජු බැර කිරීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ බැංකු සැසඳුම්වල සඳහන් හඳුනා නොගත් ලැබීම් හා උපලබ්ධි නොවූ ලැබීම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස්කර ඇති බව.	ඌව පළාත් සහා මුදල් රීති 383 අනුව කටයුතු කළ යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විශාලතම අලෙවිසැල හා ගබඩාව පැවති හල්පේ මධ්‍යස්ථානයේ නියැදි පදනම මත භෞතික තොග පරික්ෂාවේදී වසර 1 ත් 3 ත් අතර කාලයක් තුළ අලෙවි නොවී ඇති තොග ශේෂ වල වටිනාකම රු. 5,350,479 ක් විය.	මිල කමිටුවක් පත්කර මිල තීරණය කර අලෙවි කිරීමට වැඩ පිළිවෙලක් සකස්කර ඇති බව.	අලෙවි කටයුතු විධිමත් කළ යුතුය.

1.5.13 ශීර්ෂය 726 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රමාද වූ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා) කාර්යාලය මගින් බදුල්ල ස්ප්‍රිංවැලි දෙමළ විද්‍යාලයේ වර්ග අඩි 1600 ක ගොඩනැගිල්ල ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් 2025 පෙබරවාරි 25 දින සිට 2025 මාර්තු 04 දින දක්වා අය කිරීමට තිබූ රු. 348,850 ක ප්‍රමාද ගාස්තුව අයකර ගෙන නොතිබුණි.	මෙම කර්මාන්තයේ අවසන් බිල්පත මේ වන විට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර බිල්පත පරික්ෂා කරමින් පවතී. මෙහි ගිවිසුම් කාලය 2025 ජනවාරි 01 දින දක්වා දීර්ඝ කර ඇති නමුත් මේ වන විට 2025 ජනවාරි 23 දින දක්වා	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		කාලය දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව, බිල්පත් ගෙවීම් කිරීමේ දී අදාළ දඩ මුදල් බිල්පතින් අය කර ගැනීමට කටයුතු කරන බව.	
(ii)	බණ්ඩාරවෙල කුඩා කුසුම් බාලිකා විද්‍යාලයේ තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී, පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ රු.47,093,234 ක වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණු අතර එකී ගිවිසුම් ප්‍රකාරව 2018 අගෝස්තු 04 වන දින වැඩ නිම කිරීමට නියමිතව පැවතිය ද 2024 දෙසැම්බර් 06 දින වන විටත් ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් කටයුතු මන්දගාමී තත්ත්වයේ පැවතීම හේතුවෙන් 2023 වර්ෂයේදී ඉතිරි වැඩ ප්‍රමාණය බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු වෙතින් ඇස්තමේන්තුවක් පිළියෙල කර එම ඇස්තමේන්තුව යටතේ ඉදිකර අවසන් කිරීමට යෝජනා සකස් කර ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද, අවස්ථා 09 කදී කොන්ත්‍රාකරුගේ කාලය දීර්ඝ කිරීම් අනුමත කර තිබුණු අතර එලෙස දීර්ඝ කළ දින ගණන 1908 ක් වුවද, එම කාලය ද ඉක්මවා ඉදිකිරීම් ප්‍රමාදයක් පැවතීම මත ගිවිසුමට අනුව අයවිය යුතු ප්‍රමාද ගාස්තුව රු. 4,709,323 ක් විය. කෙසේ වුවද, අළුතින් පිළියෙල කළ වැඩ ඇස්තමේන්තුව ද ඉක්මවා වියදම් දරා තිබූ අතර අදාළ ඉදිකිරීම් පිරිවැය රු.53,530,572 ක බව තහවුරු විය.	අදහස් දක්වා නොතිබුණි.	ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.14 ශීර්ෂය 727 - ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 වන විට බලපත්‍ර ලාභීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 1,165,006 ක ඛනිජ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් යවා ඇති බව.	සියළු හිඟ ආදායම් අයකර ගත යුතුය.
(ii)	1990 අංක 08 දරන ඌව පළාත් මුදල් ප්‍රඥප්තියේ x පරිච්ඡේදය ප්‍රකාරව ඌව පළාත් සභාව විසින් රැස්කරන සියලුම මුද්දර ගාස්තු, මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 185(2)(ආ) උපවගන්තිය, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129(2)(ආ) උපවගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතන අරමුදලේ ආදායමක් වියයුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට එකතුව	ආපසු හැරවීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව ඉල්ලීම් නොකරන ලද මුද්දර ගාස්තු නැවත නිදහස් කිරීම් සිදු නොකරන අතර අතිරේක මුද්දර ගාස්තු නිදහස් කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බව.	පළාත් පාලන ආයතනවල ආදායම් විධිමත් පරිදි නිදහස් කළ යුතුය.

රු. 220,295,157 ක් වන මුද්දර ගාස්තු සහ අතිරේක මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන 28 ක් වෙත නිදහස් කිරීමට ඌව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

එසේම මහනගර සභා ආඥා පනත, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත්වල විධි විධාන අනුව ඉඩම් හුවමාරු මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවල ආදායමක් වන අතර එය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උපලේඛනයේ 4:3 අනුව ද තහවුරු කර ඇත. එබැවින් 1993 අංක 05 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව, එකතු කරනු ලබන මුද්දර ගාස්තු ආදායම පළාත් පාලන ආයතන වෙත හරවා යැවිය යුතු බැවින් එම ආදායම පළාත් සභා ආදායමක් නොවන බව තහවුරු වන නමුදු සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභාවේ ආදායම් ගිණුමෙහි පළාත් පාලන ආයතන වලට අදාළ රු. 744,471,092 ක දේපල පැවරීම මත මුද්දර බදු ආදායම දැක්වීම හේතුවෙන් පළාත් සභාවේ සත්‍ය ආදායම ගිණුමේ නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

1.5.15 ශීර්ෂය 731 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය ඉංජිනේරු (මාර්ග) කාර්යාල 5කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට ලේඛනගත තොගය සහ භෞතික තොගය පිළිබඳ පරීක්ෂාවේ දී රු.581,374ක තොග අතිරික්තයක් ද තොග අයිතම 4 කට අදාළව රු.88,715 ක ඌනතාවයක් ද නිරීක්ෂණය විය.	අතිරික්ත තොගයන් ලේඛන ගත කර ඇත්නම් එම තොගය අතැති තොග ලෙස භාවිතා කරන ලෙසත්, ඒ සඳහා කිසිදු ගෙවීමක් නොකරන ලෙසත්, ලේඛන ගත කර නොමැති තොගයන් කාර්යාල භූමියෙන් හා පෙරමුසු අංගන වලින් ඉවත් කර ගන්නා ලෙස අදාළ සැපයුම්කරුවන් වෙත දන්වන ලෙසත් ප්‍රාදේශීය ඉංජිනේරු වෙත උපදෙස් ලබාදෙන ලද බවත් ඌනතා තොගවලින් ඇතැම් තොග භාවිතා කර ඇති බවත් හා හඳුනාගත් ඌණතා අදාළ කාර්මික නිලධාරිනියගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරිදි තොග පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතුය.

1.5.16 ශීර්ෂය 736 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය

(අ) අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
මුදල් රෙගුලාසි 571	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් තැන්පත් කර වර්ෂ 2 ක් ඉක්ම වූ ආයතන 15 කට අදාළ රු. 15,666,472 ක තැන්පතු ශේෂයක් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි.	නියාදනය කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතුය.

(ආ) ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු. 319,866,322 ක් වූ අතර එම හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එසේම හිඟ ආදායම් තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් වාණිජ පදනමින් බදු කර ලෙස ලබා දී තිබුණු දීර්ඝකාලීන බදු බලපත්‍ර වෙනුවෙන් බදුකරුවන් 348 දෙදෙනෙකුගෙන් රු. 199,250,189 ක් ද, මධ්‍යම පාන්තික ඉඩම් බදු දීම වෙනුවෙන් බදුකරුවන් 219 දෙනෙකුගෙන් රු. 22,510,149 ක් ද, වාර්ෂික ඉඩම් බදු දීම වෙනුවෙන් බලපත්‍ර 91 ට අයත් බදුකරුවන් 91 දෙනෙකුගෙන් රු. 3,026,371ක් ද වශයෙන් 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 224,786,709 ක් වූ ඇතැම් හිඟහිටි බදු ආදායම් වසර 30කට වඩා වැඩි කාලයක සිට පැවතිය ද එම හිඟ බදු ආදායම් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම තුළින් ඉඩම් බදු අය කර ගැනීම සම්බන්ධයෙන් ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දුර්වල කාර්යසාධන මට්ටමක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.	ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **ඌව පළාත් සභාව සහ පෞද්ගලික සමාගමක් අතර ගිවිසුම්ගතව ක්‍රියාත්මක වන සූර්යබල පද්ධති ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 නොවැම්බර් 24 දිනැති අංක 2/PVC/ACP/06/Solar දරන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ගේ ලිපිය අනුව ඌව පළාත් සභාව මගින්, සූර්ය බලශක්ති විදුලිය ජනනය කිරීම සඳහා ඌව පළාත් සභාව සතු ගොඩනැගිලි වහලවල් යොදාගැනීමේ ව්‍යාපෘතිය රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් (Public Private Partnership (PPP)) ලෙස හා ලංසු ලේඛනවල 01 ඡේදය අනුව Turnkey ව්‍යාපෘතියක් ලෙස දක්වා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 03.10 ඡේදය අනුව මෙවැනි ප්‍රසම්පාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය වුවද එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය රජයේ ගොඩනැගිලිවල වහලය මත පුද්ගලික අංශයේ ආයෝජනයකින් , ඌව පළාත් සභාව හා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වීමේදී පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වී සිදුකරන ව්‍යාපෘතියක් බැවින් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් ලෙස ව්‍යාපෘති යෝජනාවල නම් කරන ලද බවත්, ඒ සඳහා සූර්ය පැනල පද්ධතිය සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම ඌව පළාත් සභාවේ මැදිහත්වීමකින් තොරව පෞද්ගලික අංශය විසින්ම සිදුකළ යුතු බැවින් Turnkey ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගන්නා ලද බවත් මෙම ව්‍යාපෘතිය පළාත් අරමුදල සතු ගොඩනැගිලිවල වහල කුලියට දීමක් හෙයින් මධ්‍යම රජයෙන් එවැනි අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවය පැන නොනැගුණ බව.	ලංසු ලේඛනවල Turnkey ව්‍යාපෘතියක් ලෙස දක්වා ඇති බැවින් ඒ අනුව අදාළ අනුමැතියක් ලබා ගත යුතුය.
(ii)	පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු ඇමතු 2019 මාර්තු 26 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක (Cabinet Appointed Procurement Committee) සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක (Technical Evaluation Committee) අනුමැතිය අවශ්‍ය වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	පළාත් සභා අරමුදලට අයත් වත්කම් බැවින් සූර්ය පැනල සවි කිරීම සඳහා බදුදීම වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ සහභාගීත්වයෙන් යුත් රැස්වීම්වලදී ගත් තීරණවලට අනුව සිදුකළ කටයුත්තක් බවත් මෙම කටයුතු ගරු ආණ්ඩුකාර තුමා වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් යොමු කර ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන ඒ අනුව, ක්‍රියාත්මකවීම සිදු වී ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන වලට කටයුතු කළ යුතුය.
(iii)	ප්‍රසම්පාදන ලේඛනවල Condition of Contract හි 03 වන වගන්තිය අනුව රු.2,500,000 ක කාර්යසාධන ලේඛනයක් ලබාදෙන ලෙස දන්වා තිබුණ ද ව්‍යාපෘතියේ ගිවිසුම් වටිනාකම අනුව ලබාගත යුතුව තිබුණු කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම රු.292,822,562 ක් විය. ගිවිසුම අනුව ව්‍යාපෘතියේ 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම වියයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය සඳහා කාලය දීර්ඝ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවුණ ද කොන්ත්‍රාත්කාර සමාගම විසින්	වත්කම් අත්පත් කර ගැනීම සඳහා වන පිරිවැය ඇස්තමේන්තුවට අනුව මෙම අගය නිවැරදි වන අතර මෙය වත්කම් කුලියට දීමක් වන හෙයින් ප්‍රමාණයන්ට අනුව ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය අසාර්ථක වුවහොත් ප්‍රසම්පාදන අස්ථිත්වයේ ආරක්ෂාව සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම අරමුණ බැවින් ඒ අනුව, මෙම	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	රු. 2,500,000 ක කාර්යසාධන සුරක්ෂණයේ කාලය 2022 ජුනි 22 දින සිට 2022 දෙසැම්බර් 22 දින දක්වා දීර්ඝ කර ලබාදී තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය නිමකර හෝ කාලය දීර්ඝ කර නොතිබුණ අතර කාර්යසාධන බැඳුම්කරය ද මුදල් කර නොතිබුණි. එසේම කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කළ ගිවිසුමේ කාර්යසාධන ඇපකරය පිළිබඳව කිසිදු වගන්තියක් ඇතුළත් නොවීය.	කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය අසාර්ථක වුවහොත් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට යන වියදම සහ එම කාලය තුළ ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා මෙම කාර්යසාධන මුදල ප්‍රමාණවත් වන බවත් එසේම, කාර්යය සාධන සුරක්ෂණය ඉහළ අගයක් ඉල්ලුම්කළ හොත් එය ලංසුකරු විසින් ආයෝජනය කරන බැවින් එය ඔහුගේ ද්‍රවශීලතාවයට බලපානු ඇති බවත් එයින් ලංසු මිල අඩු වීමට බලපානු ඇති බව.	
(iv)	ව්‍යාපෘතියට අදාළ ගිවිසුමේ 6(xvi) ඡේදයේ සඳහන් වන පරිදි ගිවිසුම්ගත දිනයේ සිට මාස 12 ක කාලයක් තුළ මෙගාවොට් 46.35 ක ධාරිතාවයෙන් යුතු සූර්ය පැනල සවිකර අවසන් කළයුතු වුවත් 2024 නොවැම්බර් 30 දිනටත් ගිවිසුම්ගත වහලවල් 879 න් 450 ක පමණක් සූර්ය පැනල සවිකර තිබුණ අතර එයින් උත්පාදනය කෙරෙන විදුලි ධාරිතාවය මෙගාවොට් 20 ක ප්‍රමාණයක් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙන් 2023 හා 2024 වර්ෂවල ඌව පළාත් සභාවට ලැබිය යුතු ආදායම රු. 73,258,680 ක් පමණ අහිමි වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ සූර්ය පැනල ස්ථාපිත කිරීම සඳහා සාමාන්‍ය වශයෙන් සලකා වසරක කාලයක් ලබා තිබුණ ද වසරක කාලයක් තුළ මෙවැනි ධාරිතාවයකින් යුතු ව්‍යාපෘතියක් අවසන් කිරීම අභියෝගකාරී බව ලංකා විදුලිබල මණ්ඩලය සමග සිදුකළ සාකච්ඡාවේදී නිරීක්ෂණය වූ බවත්, 2021 කොවිඩ් වසංගතය සහ 2022 වසරේ පැවති ආර්ථික තත්ත්වය අනුව සූර්ය පැනල ආනයනය කිරීමට නොහැකිවීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ උපකරණ හිඟය ආදී කරුණු හේතුවෙන් අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් දක්වා තිබුණි.	ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය.
(v)	ව්‍යාපෘතියට අදාළව බද්ධ ගිණුමට ලැබී ඇති ආදායමෙන් පළාත් සභාවට ලැබිය යුතු සියයට 15.2 ක ආදායම රු. 105,440,631 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ ඉන් රු. 104,868,224 ක් පමණක් අදාළ ඉතිරිකිරීමේ ගිණුමට බැර කර තිබුණු බැවින් රු. 572,407 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම තත්ත්වය හඳුනාගෙන ඇති අතර මෙම මුදල් සමාගමෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(vi)	ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2021 ඔක්තෝබර් 07 දිනැති අංක 2/UPC/ACP/06 දරන ලිපිය මගින්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙනුවෙන් මාසික දීමනා ගෙවීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණු අතර ඒ අනුව 2021 නොවැම්බර් 03 දින සිට 2024 නොවැම්බර් 29 දින දක්වා නිලධාරීන් 14 කට රු. 7,359,784 ක දීමනා ගෙවා තිබුණි. පළාත් ප්‍රධාන ලේකම්වරුන් ඇමතු 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි 2018 ජුනි 19 දින	විශේෂයෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘතියක් පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමේදී 03/2018 චක්‍රලේඛනයේ විධිවිධාන බාධාවක් නොවන බවත්, මෙහෙයුම් කමිටු රැස්වීමේදී ඇතිකරගත් එකඟතාවය මත සිදුකරන ලද විධිමත් ඉල්ලීමක් අනුව ආයතනය විසින් ලබාදුන් මුදලින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත දීමනා ගෙවා ඇති බව.	සමාගම ගිවිසුමේ කොන්දේසි කඩකර තිබියදී, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග නොගෙන දීමනා ලබාගෙන තිබුණු බැවින් චක්‍රලේඛ උපදෙස් වලට අනුගත විය යුතුය.

අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබාදුන් තීරණය අනුව මෙවැනි දීමනා ගෙවීමට පෙර මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව දක්වා තිබුණ ද එය නොසලකා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ගෙවා තිබුණි. එසේම ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඉල්ලූ ලිපිය අනුව මෙම දීමනා සමාගම විසින් ගෙවන බව දන්වා තිබුණ ද ඒ පිළිබඳ ලංසු ලේඛනවල සහ ගිවිසුමේ ඇතුළත්ව නොතිබුණි.

එසේම, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4.4 අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහභාගිවන කිසිම නිලධාරියෙකු යම් ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී පෞද්ගලික ප්‍රතිලාභ ලබා නොගතයුතු වුවද, ප්‍රසම්පාදන කටයුතු වලට ඍජුවම දායක වූ තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් වන නිලධාරීන් 07 දෙනෙකු මෙම දීමනා ලබාගෙන තිබුණි.

එසේම 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 97 වගන්තිය අනුව මෙම දීමනාව ලබාදීම සහ ලබාගැනීම රජය සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ලබාදෙන අල්ලසක් ලෙස විගණනයේදි නිරීක්ෂණය කෙරේ.

(ඇ) අනෙකුත් අත්තිකාරම් ගිණුම්

අයවිය යුතු ණය ශේෂ

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාලවලින් බැහැරට ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 37,111,064 ක් වූ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ විධිවිධාන සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ)(ආ)(ඉ) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. එසේම ඌව පළාත් සභාවේ ආයතන 08 කට අදාළ රු. 1,010,846 ක හඳුනා නොගත් ණයගැති ශේෂයක් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා ආයතන දැනුවත් කර සාකච්ඡා කර ඇති බව, විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් පියවා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පවතින ද්‍රවශීලතා ගැටළු නිසා ණය පියවීම ප්‍රමාද වී ඇති බව, මියගිය හා වැඩ හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පියවා ගැනීමට අදාළ ආයතනවලට උපදෙස් ලබා දී ඇති බව.	සියළු ණය අයකරගත යුතුය.

(ඉ) නිරවුල් කළයුතු ණය ශේෂ

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 09 ක් වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 29,874,528 ක් වූ ණය ශේෂය නිරවුල් කර නොතිබුණි. එසේම පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 05 කට අදාළ රු. 9,335,891 ක හඳුනා නොගත් ණයහිමි ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි.	වෙනත් පළාත් සභා මධ්‍යම රජය හා පළාත් පාලන ආයතන වලින් පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් මේ තුළ අන්තර්ගත වේ. මෙම ශේෂයන් මේ වන විට ක්‍රමිකව නිරවුල් වෙමින් පවතින බව.	සියළු ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

(අ) මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 1,840,666,085 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,943,894,499 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඌනතාවය රු. 1,103,228,414 කින් අඩු වී තිබුණි.

(ආ) ආදායම් හා වියදම් විචලනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

	2024	2023	විචලනය
	තත්‍ය (රු.)	තත්‍ය (රු.)	(රු.)
පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්			
බදු ආදායම	2,342,334,896	1,880,523,416	461,811,480
බදු නොවන ආදායම	961,318,722	737,383,636	223,935,086
රජයේ ප්‍රදාන	38,995,747,682	33,203,977,046	5,791,770,636
එකතුව	42,299,401,300	35,821,884,098	6,477,517,202

වියදම

	2024	2023	විචලනය
	තත්‍ය (රු.)	තත්‍ය (රු.)	(රු.)
පුනරාවර්තන වියදම්			
පුද්ගලික පඩිනඩි	30,166,448,329	26,346,038,860	3,820,409,469
අනෙකුත් පුනරාවර්තන	12,222,454,566	11,380,202,817	842,251,749
උප එකතුව	42,388,902,895	37,726,241,677	4,662,661,218
පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම	1,751,164,490	1,039,536,919	711,627,571
එකතුව	44,140,067,385	38,765,778,596	5,374,288,789
(ඌනතාවය)	**(1,840,666,085)**	**(2,943,894,498)**	**1,103,228,413**

	(රු.)
- පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම	1,751,164,490
- ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු ලබන ප්‍රාග්ධනිත කරනු ලබන වියදම්	2,302,615,710
රාජ්‍ය ආයෝජන	**4,053,780,200**

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. 42,299,401,300 ක් වූ අතර ඉන් රු. 38,995,747,682 ක් හෙවත් සියයට 92.19 ක් රජයේ ප්‍රදාන විය. බදු ආදායම රු. 2,342,334,896 ක් එනම් මුළු ආදායමෙන් සියයට 5.53 ක් ද බදු නොවන ආදායම රු. 961,318,722 ක් එනම් මුළු ආදායමෙන් සියයට 2.27 ක් ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු. 42,299,401,300 න් පුනරාවර්තන වියදම් සඳහා (ක්ෂය හැර) රු. 37,431,477,951 ක් එනම් සියයට 88.49 ක් ද, රජයේ ආයෝජන සඳහා රු. 4,053,780,200 ක් එනම් සියයට 9.58 ක් ද උපයෝජනය කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

මූලාශ්‍රය	අනුමත මුදල රු.	වැය කළ මුදල රු.	ඌන උපයෝජනය රු.
සාමූහික ප්‍රදාන	35,880,020,000	35,170,275,000	709,745,000
උපමාන පාදක ප්‍රදාන	616,000,000	462,000,000	154,000,000
පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන	3,169,000,000	2,376,750,000	792,250,000
ලෝක බැංකු ආධාර			
- විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන(අධ්‍යාපන)	560,000,000	560,000,000	-
- විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය)	400,000,000	400,000,000	-
එකතුව	40,625,020,000	38,969,025,000	1,655,995,000

ඌව පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා අනුමත කර ඇති මුදල රු. 40,625,020,000 ක් වුවද රජය විසින් ලබා දී ඇති අක් මුදල රු. 38,969,025,000 ක් වේ. මේ අනුව 2024 වර්ෂයට අදාළව ලබා නොදුන් අක් මුදල රු.1,655,995,000 කි.

(ආ) පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. මිලියන 4,112 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ ව්‍යාපෘති යෝජනා 2797 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

යෝජනා ගණන

ව්‍යාපෘති විස්තර	නව වැඩ	අවිච්ඡේද වැඩ	මුළු වැඩ	මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.
සම්පූර්ණයෙන් නිමකළ	2626	18	2644	4,112,079,368
50% ට වඩා වැඩියෙන් නිමකළ	37	07	44	
50% ට වඩා අඩුවෙන් නිමකළ	34	0	34	
ආරම්භකර නොතිබූ	73	0	73	
මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ	02	-	02	
එකතුව	2772	25	2797	